මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක: 04/2023

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2023.04. 18

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ තොරතුරු MISCO පද්ධතිය මඟින් යාවත්කාලීන කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක COM/TRANS/MISCO සහ 2023.03.15 දිනැති ලිපිය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි.

02. ඒකාබද්ධ සේවාවන්හි නිලධරයන්ගේ තොරතුරු රැස් කිරීම, කාර්ය මණ්ඩල තොරතුරු යාවත්කාලීන කිරීම, ස්ථාන මාරු ඉල්ලීම් ඉදිරිපත් කිරීම ඇතුළුව කාර්යයන් රැසක් මාර්ගගතව සිදුකිරීමේ අරමුණින් ඒකාබද්ධ සේවා අංශය විසින් **MISCO** මෘදුකාංගය හඳුන්වා දී ඇත.

03. ඒ අනුව, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත ඔබ කාර්යයාලවල සේවයේ නියුතු ඒකාබද්ධ සේවයට අයත් සියලු නිලධාරීන්ගේ තොරතුරු **2023.05.02** දිනට පෙර **MISCO** පද්ධතියට ඇතුළත් කිරීම/ යාවත්කාලීන කිරීම කළ යුතු අතර, තම තොරතුරු ඇතුළත් කිරීමේ/ යාවත්කාලීන කිරීමේ වගකීම තමා සතු බවට අදාළ නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දන්වමි.

04. එම පද්ධතියට ඇතුළත් කර ඇති තොරතුරු යොදාගනිමින් ඉදිරියේ දී ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගේ සියලු ආයතනික කටයුතු කිරීමට යෝජිත බැවින් තම දත්ත ඇතුළත් නොකළ/ යාවත්කාලීන නොකළ නිලධරයන්ගේ ස්ථිර කිරීම්, උසස්වීම්, ස්ථාන මාරුවීම් හා මුදාහැරීම් වැනි ආයතනික කටයුතුවල ප්‍රමාදයන් ඉදිරියේ දී සිදුවිය හැකි බවට ද එම නිලධාරීන් දැනුවත් කරන්නේ නම් මැනවි.

05. **MISCO** පද්ධතිය වෙත පහත සබැඳින් ඔස්සේ පිවිස, එහි අතුරු මුහුණතේ ඇති Help සබැඳිය ඔස්සේ පරිශීලක අත්පොත (User Guide) පරිශීලනය කිරීමෙන් මේ සඳහා උපකාර වන තොරතුරු ලබාගත හැකිය.

- **LGN** ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයාගනු ලබන්නේ නම් **http://10.250.1.112/misco/**
- වෙනත් ජාලයන් ඔස්සේ අන්තර්ජාල පහසුකම් සපයා ගනු ලබන්නේ නම් **http://43.224.125.68/misco/**

06. ඒකාබද්ධ සේවාවේ නිලධාරීන්ගේ ආයතනික කටයුතු වඩා කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා මෙම ප්‍රයත්නය සාර්ථක කරගැනීමට ඔබගේ කාරුණික සහයෝගය අපේක්ෂා කරමි.

**ජේ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්